# මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ මිථ්‍යාමත, විශ්වාස සහ සංජානනයන් පිළිබඳ මහජන මත විමසුම් සමීක්ෂණය- 2021

**පර්යේෂණ අංශය**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.**

## හැදින්වීම:

මත්ද්‍රව්‍ය භාවිතය ව්‍යාප්තවීම සඳහාත් ඇබ්බැහිකාරී චර්යා වර්ධනය වීම සඳහාත් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් පවතින මිත්‍යා මත, විශ්වාස සහ සංජානනයන් බලපෑම් කළ හැකිය. මෙම අධ්‍යයනය මත්ද්‍රව්‍ය දූර්භාවිතය සම්බන්ධයෙන් පවතින මිත්‍යාමත, විශ්වාස හා සංජානනයන් පිළිබඳ මහජන මත සමීක්ෂණයක් ලෙස සිදු කර ඇත.

මාර්ගගත ක්‍රමය ඔස්සේ ග්‍රාහකයන් සඳහා ස්වේච්ඡාවෙන් පිළිතුරු සැපයිය හැකි Google ෆෝරමයක් ආධාරයෙන් ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මඟින් මෙම මහජන මත විමසුම් සමීක්ෂණය සිදුකරන ලදී. දත්ත දායකයන් සියලු දෙනා වයස අවු:15-64 කාණ්ඩයට අයත් විය. ග්‍රාහකයන් 175 දෙනෙක් මේ සඳහා සම්බන්ධ වී ඇත.

ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කෙරිණි. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අනාවරණයන් අතර මත්ද්‍රව්‍ය දූර්භාවිතය සම්බන්ධයෙන් සාමාන්‍ය පොදු මහජනතාවගේ සවිඥානිකත්වය යහපත් මට්ටමක පවතින බවයි. මත්ද්‍රව්‍ය දූර්භාවිතයෙන් මිදීම සඳහා පවතින උනන්දුව යහපත් මට්ටමකින් නිරීක්ෂණය වූ අතර සාමාන්‍ය පොදු මහජනතාව මතින් නිදහස් කිරීම සඳහා තවදුරටත් අවකාශය පවතින බව 75.5% ක ප්‍රතිශතයක් ලංකාව තුළ සියලු මත්ද්‍රව්‍ය තහනම් කිරීමට එකඟතාව පළ කිරීම තුළ පෙනී යන ලදී. මත්ද්‍රව්‍ය නිවාරණයෙහිලා නීතිය හෝ විවිධාකාර ව්‍යුහයන් කෙරෙහි විශ්වාස කිරීම සහ නම්‍යශීලී වනවාට වඩා සාමාන්‍ය පොදු මහජනතාවට ඒ සඳහා විශාල භූමිකාවක් පවතිනවාය යන ආකල්පය වෙත එළඹ තිබීමයි. මෙහිදී මත්ද්‍රව්‍ය දූර්භාවිතය ආශ්‍රිත තත්වයන්, මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලන යාන්ත්‍රණය පිළිබඳ ආකල්ප හා අදාල දත්ත, මත්ද්‍රව්‍ය භාවිතය සහ මාධ්‍ය ක්‍රියාකාරීත්වය, කංසා/ගංජා භාවිතය සහ ව්‍යාප්තියට අදාලව මහජන මතය සමීකෂණය හරහා විමර්ශනය කිරීම සිදුවිය. අධ්‍යයන නිර්දේශ ලෙස  මත්ද්‍රව්‍ය දූර්භාවිතය පිළිබද නිවාරණ වැඩසටහන් නව මුහුණුවරක් ගතයුතු බව, නව තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතකළ යුතුබව, මත්ද්‍රව්‍ය දූර්භාවිතයේ යෙදෙන සහ දූර්මත දරණ සීමිත පිරිස (30%-40%) ආමන්ත්‍රණය කිරීම ආදී වශයෙන් ඉදිරිපත් කළ හැකිය

## 1.2 අධ්‍යයන පසුබිම

ගෝලීය ප්‍රවාහය තුළ 19 වන සියවසෙන් පසුව කාර්මීකරණයේ බලපෑම සහ දේශීය වශයෙන් විවෘත ආර්ථිකය විස්තාරණය වීමත් සමඟ ලාංකීය සන්දර්භය තුළ පැවති බොහෝ අංග ඉදිරියට ගමන් කිරීමත් සිදුවීම ආරම්භ විය. ගෝලීය වශයෙන් කාර්මීකරණයේ අතුරු ප්‍රතිඵල ලෙස ලෝකයේ ස්ථාපිත වීම ආරම්භ වූ "සමාජ ප්‍රශ්න" වල බලපෑම දේශීය වශයෙන් ලාංකීය ප්‍රජාවටද අත්විඳීමට සිදුවීම ලක්ෂණයයි. විශේෂයෙන්ම විවෘත ආර්ථිකය ක්‍රමවේදය සඳහා රට විවෘත වීමත් සමඟ ඇති වූ ආර්ථික සංග්‍රාමයට අමතරව රටේ සෑම අංශයකම ධනාත්මක මෙන්ම ගැටුම්කාරී වාතාවරණ නිර්මාණය වීම සඳහා එය බලපෑම් කිරීම ආරම්භ විය. මත්ද්‍රව්‍ය භාවිතය, මත්වීම, මත්ලෝලීත්වය යන සාධක ලෝක ඉතිහාසයේ ආරම්භ කාළ පරිච්ඡේදවල සිට පැවත එන්නක් බව පෙනී යන කරුණකි.

මුල්කාලීනව මත්ද්‍රව්‍ය වර්ගීකරණයන්, විවිධ මත්ද්‍රව්‍ය වර්ග, මත්වීම, ඇබ්බැහිය, යන කාරණා පිළිබඳව එතරම් අවබෝධයක් හෝ සාකච්ඡාවට බඳුන් වීමත් නිරීක්ෂණය නොවුණද මෑත කාලීන සමාජය තුළ මත්ද්‍රව්‍ය පිළබඳව වඩා විද්‍යාත්මක  දෘෂ්ටිකෝණයකින් සාකච්ඡා කිරීම ආරම්භ වී ඇත.

ලෝකයේ මිලියන 190 කටත් වැඩි ජනගහණයක් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුව සිටින  අතරම එය වර්ධනය වීම මේවන විට සිදුව තිබේ. විශේෂයෙන්ම අවුරුදු 30ට අඩු කාණ්ඩයට  අයත්  තරුණ වැඩිහිටි ප්‍රජාව මීට අයත් වේ. මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳව සාකච්ඡා කිරීමේදී මනෝ ක්‍රියාකාරී මත්ද්‍රව්‍ය භාවිතය සඳහා බලපාන  හේතු ගණනාවක් පවතින බව පෙනී යයි.

- කුතුහලය සහ සමවයස් කණ්ඩායම් වල බලපෑම (විශේෂයෙන්ම පාසල් දරුවන් සහ තරුණ වැඩිහිටි ප්‍රජාව).
- වෛද්‍ය නිර්දේශය සහිතව වේදනා සමනය සඳහා නිර්දේශ කරන ලද අවභාවිතය.
- හුදු විනෝදය පදනම් කරගත් අරමුණු සඳහා
- තමා ජීවත්වන පරිසරය  තුළ මත්ද්‍රව්‍ය සුලබතාවයක් සහිතවීම.
- ඇසුරු කරන්නන් භාවිත පිරිසක් වීම.
- නොදැනුවත්කම හා අඩු අධ්‍යාපන මට්ටම.
- මත්ද්‍රව්‍ය සඳහා පවතින  ප්‍රචාරණය / ප්‍රචාරණ මාධ්‍යවල බලපෑම, මත්ද්‍රව්‍ය ප්‍රවර්ධනය.

එසේම මේ කරුණු හැරුණු විට පුද්ගලයා මත්ද්‍රව්‍ය දුර්භාවිතය සඳහා යොමු වීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් ලෙස මත්ද්‍රව්‍ය කෙරෙහි ගොඩනගාගෙන තිබෙන මිත්‍යාමත, විශ්වාස සහ සංජානනයන්ගේ බලපෑම සාකච්ඡා කළයුතු මට්ටමක පවතින බව පෙනී යයි.

විශේෂයෙන්ම පුද්ගලයා මත්ද්‍රව්‍ය භාවිතය (දුර්භාවිතය)  සඳහා  යොමුවීම  නව  යොවුන්  වියේ  සිට ඇරඹීම ලක්ෂණයයි.  එසේම, මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය  සම්බන්ධයෙන්  ඒ  ඒ  මත්ද්‍රව්‍ය  සඳහා ගොඩනගන  ලද  මිත්‍යාමත,  විශ්වාස සහ සංජානනයන් පවතී. එහිදී එම එක් එක් මත්ද්‍රව්‍ය සඳහා ලබාදෙන සාධාරණීකරණයන් මත පුද්ගලයා එළඹ ගැනීම  තුළ පුද්ගලයා මත්ද්‍රව්‍ය භාවිතය අඛණ්ඩ ව පවත්වා ගෙන යෑම සිදුවේ. ද්විතියික මූලාශ්‍ර මඟින් අනාවරණය කරගත් එවැනි **මිත්‍යාමත හා සංජානනයන්** කිහිපයක් පහත සඳහන් කර ඇත.

- මද්‍යසාර පිළිබඳව පවතින මිත්‍යාමත පිළිබඳව සැලකිල්ලට ගැනීමේදී මද්‍යසාර භාවිතය ගැටලුකාරී නොවන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී පාලනය කරගැනීම සිදුකළ හැකිය.  එසේම "මත්පැන් පානය භයානක දෙයක් නොවේ." සැර මද්‍යසාර (Hard Liquor) වල තරම් බියර් වර්ග වල මධ්‍යසාර/ ඇල්කොහොල් අඩංගු නොවේ, මධ්‍යසාර අවම ප්‍රමාණයක් භාවිතා කළද රිය ධාවනයට බාධා ඇති නොකරයි.



- ඔබට මධ්‍යසාර භාවිතා කළහැකි ඉහළ ධාරිතාවයන් පවතියි නම් ඔබට මධ්‍යසාර භාවිතය ගැටලුවක් නොවේ.
- ගංජා, මර්ජුවානා පිළිබඳව පවතින මිත්‍යාමත, විශ්වාසයන් හා සංජානනයන් විමසීමේදී; මර්ජුවානා සඳහ ඇබ්බැහියක් ඇති නොවේ (https://www.encyclopedia.com/education/ encyclopedias-almanacs-transcripts-and-maps/valuely-and-belifes-existentionalmodals- addiction).
- ඔබ සති අගදී මර්ජුවානා භාවිත කළහොත් සඳුදා දිනය වන විට ඔබට ගැටලුවක් ඇති නොවේ. (http://www.smarys-ca.edul and- facts.pdf)
- මර්ජුවානා/ගංජා භාවිතය දුම්වැටි තරම් ගැටලු ඇති නොකරයි(https://www.stmarys-ca.edu/sites/defaults/files/attachments/files/drug-myths-and-facts-pdf ).
- දුම් කොළ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් ද විවිධාකාර මිත්‍යාමත, විශ්වාස පවතී. දුමක් ලෙස ලබා නොගන්නා දුම් කොළ මඟින් පිළිකාවක් ඇති නොවේ(https://www.stmarys-ca.edu/sites/default/files/attachments/files/drug-myths-and-facts.pdf ).

## 1.3 පර්යේෂණ ගැටලුව

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ සාමාන්‍ය මහජනතාව අතර පවතින මිත්‍යාමත, විශ්වාස සහ සංජානනයන් මොනවාද?

## 1.4 පර්යේෂණ ප්‍රශ්න

- මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා සම්බන්ධ මිත්‍යාමත, විශ්වාස සහ සංජානනයන් කෙරෙහි පුද්ගලයාගේ නැඹුරුතාවය කොපමණද?
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධව ගොඩනැගී තිබෙන එම මිත්‍යාමත, විශ්වාස, හා සංජානනයන් මත පුද්ගල කේන්ද්‍රීය සාධක වල ඇති වී තිබෙන වෙනස්කම් මොනවාද?
- මෙම මත, විශ්වාස හා සංජානනයන් පිළිබඳව වැඩි උනන්දුවක් / නැඹුරුතාවයක් දක්වන සමාජ කණ්ඩායම් මොනවාද? (කවුද?)

## 1.5 පර්යේෂණ අරමුණ

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ මහජනතාව අතර පවතින දුර්මත, විශ්වාස හා සංජානනයන් හඳුනාගැනීම.

### 1.5.1 උප අරමුණු

- එම දුර්මත හා සංජානනයන් පිළිබඳ වැඩි උනන්දුවක් දක්වන සමාජ කණ්ඩායම් හඳුනා ගැනීම.
- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ මිත්‍යා මත, විශ්වාස හා සංජානනයන් සඳහා දිරිගන්වන ප්‍රචාරණ මාධ්‍යයන් හඳුනා ගැනීම.

- මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධ මිත්‍යා මත, විශ්වාස හා සංජානනයන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කරනු ලබන පෙළඹවීම හඳුනා ගැනීම.
- එම දුර්මත හා සංජානනයන් දුර්වල කිරීම සඳහා වන නිවාරණ/ මැදිහත්වීම් වැඩිදියුණු කිරීම.

**1.6 සාධාරණීකරණය**

පුද්ගලයන් අතර මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම හා මත්භාවිතයට ඇබ්බැහි වීම සඳහා මත්ද්‍රව්‍ය පිළිබඳව සමාජය තුළ පවතින මිත්‍යාමත, විශ්වාස හා සංජානනයන් බලපෑම් කරනු ලබන විවිධ අධ්‍යයන හරහා තහවුරු වී ඇත. එවැනි වැරදි සංජානනයන් මොනවාද? එවැනි සංජානනයන් නිර්මාණය වන මූලාශ්‍ර මොනවාද? ප්‍රවර්ධනය කරනු ලබන මාධ්‍ය මොනවාද යන්න තහවුරු කර ගැනීම අවශ්‍ය ඉදිරි මැදිහත්වීම් සඳහා පදනමක් සපයනු ලබයි. පුද්ගල පරිකල්පනය සහ සංජානනයන් සාධනීය ලෙස වෙනස්කර ඔවුන් වැරදි චර්යාවන්ට යොමු වීම වළක්වා ගැනීමට නම් එවැනි පරිකල්පනයන් සහ සංජානනයන් වාඩාත් තාක්‍ෂණික ලෙස හඳුනා ගැනීම අවශ්‍ය වේ.

**1.7 පර්යේෂණයේ වැදගත්කම**

මෙම අධ්‍යයනය/ සමීක්ෂණය මගින් අනාවරණය කරනු ලබන දත්ත හා තොරතුරු මගින් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්හි අවශ්‍ය මැදිහත්වීම් සඳහා ඵලදායී ලෙස යොදා ගැනීම, මත්ද්‍රව්‍ය නිවාරණ හා සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන්වලදී අදාළ දැනුවත් කිරීම් සහ නිවැරදි මැදිහත්වීම් ලබාදීමට අවශ්‍ය මිනුමක් ලෙස උපයෝගී කරගැනීම, මත්ද්‍රව්‍ය ප්‍රචාරණය දිරිමත් කරන කොටස් පිළිබඳ දැනුවත් වීම, මත්ද්‍රව්‍ය භාවිතය පාලනය සඳහා නව ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කිරීමේදී උපයෝගීතාවයකින් යුක්ත බව තීරණය කළ හැකිවේ.

**1.8 පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සමීක්‍ෂණ ක්‍රමය ( Survey Method ) පදනම් කරගනිමින් සිදු කරන ලදී. එහිදී පුද්ගල ආකල්ප හා මත පිළිබඳ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කල බැවින් මත විමසුම් සමීක්‍ෂණයක් ලෙස සිදු කරන ලදී. දත්ත ඒකරාශී කර ගැනීමේදී ගුණාත්මක මෙන්ම ප්‍රමාණාත්මක දත්තද ආශ්‍රය කරගැනීමද සිදු විය. මෙහිදී මාර්ගගත ක්‍රමවේදය හරහා Google පෝරමයක් යොදා ගනිමින් වයස අවුරුදු 15-64ත් අතර ජනගහනයෙන් ස්වේච්ඡාවෙන් පිළිතුරු ලබා ගැනීම සිදු කරන ලදී.

**1.9 ඉලක්ක කණ්ඩායම් සහ දත්ත රැස්කිරීම.**

මෙහිදී මාර්ගගත ක්‍රමය ඔස්සේ ග්‍රාහකයන් වෙත ස්වේච්ඡාවෙන් පිළිතුරු සැපයීමට Google පෝරමයක් ආධාරයෙන් ව්‍යුහගත ප්‍රශ්නාවලියක් යොමු කිරීම සිදු විය. ඒ සඳහා ග්‍රාහකයන් 175 දෙනෙකුගේ ප්‍රතිචාර ලැබී තිබුණි. සියලු පුද්ගලයන් වයස අවුරුදු 15-64ත් අතර කාණ්ඩායමට අයත් පුද්ගලයන් විය.

### 1.10 දත්ත විශ්ලේෂණය.

SPSS මෘදුකාංගය භාවිතයෙන් ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී.

## 2. දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ විද්‍යාත්මක පැතිකඩ

මෙහිදී සමස්ත නියදියේ ස්ත්‍රී/පුරුෂ නියෝජනය, වයස් ප්‍රමාණය, අධ්‍යාපන මට්ටම, ප්‍රජා විද්‍යාත්මක විසරණය, රැකියාවන්, විවාහක අවිවාහක බව යනාදිය පිළිබඳ විශ්ලේෂිත දත්ත පහත ඉදිරිපත් කර ඇත.

| | |
|---|---|
| 2.1 සමස්ත නියැදිය හා ස්ත්‍රී පුරුෂ නියෝජනය. | ❖ අධ්‍යයනය සඳහා සහභාගි වු සමස්ත නියැදිය 175 කි.<br>❖ කාන්තා නියෝජනය 69 (39.4%)කී.<br>❖ පිරිමි නියෝජනය 106 (60.6%)කි. |

| | |
|---|---|
| 2.2 වයස් සංයුතිය. | නියැදියේ සමස්ත දත්ත දායකයින්ගේ වයස් මට්ටම් සැලකිල්ලට ගැනීමේ දී,<br>අවුරුදු 18ට අඩු 6 (3.4%) ක් ද,<br>අවුරුදු 19-25 අතර 40 (22.9%) ක්ද<br>අවුරුදු 26-35 අතර 86 (49.1%) ක්ද,<br>අවුරුදු36-50 අතර 31 (17.7%) ක්ද,<br>අවුරුදු 51-60 අතර 9 (5.1%)ක්ද,<br>අවුරුදු 61-70 අතර 2 (1.1%) ක්ද,<br>70 වැඩි 1 (0.6%) ක්ද නියැදිය තුළ නියෝජනය විය.<br>• **නියැදියේ බහුතර නියෝජනය වයස අවුරුදු 26-35 (49.1%) කාණ්ඩයට අයත් වේ.** |

### 2.3 අධ්‍යාපන මට්ටම.

අධ්‍යාපන මට්ටම පිළිබඳව සැලකිල්ලට ගැනීමේ දී;

| අධ්‍යාපන මට්ටම | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| පහ ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද | 1 | 0.6% |

| | | |
|---|---|---|
| අට ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලද | 3 | 1.7% |
| සා පෙළ සමත් | 22 | 12.6% |
| උ/ පෙළ සමත් | 39 | 22.3% |
| | | |
| ඩිප්ලෝමාධාරි | 33 | 18.9% |
| උපාධිධාරි | 53 | 30.3% |
| පශ්චාත් උපාධි හෝ ඉහළ | 24 | 13.7% |

**2.4 ප්‍රජා විද්‍යාත්මක පැතිකඩ.**

දිස්ත්‍රික්ක අනුව දත්ත දායකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්කය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අම්පාර | 2 | 1.1 (%) |
| අනුරාධපුර | 4 | 2.3 (%) |
| බදුල්ල | 5 | 2.9 (%) |
| කොළඹ | 24 | 13.7(%) |
| ගාල්ල | 8 | 4.6 (%) |
| ගම්පහ | 19 | 10.9 (%) |
| හම්බන්තොට | 1 | 0.6 (%) |
| කළුතර | 24 | 13.7 (%) |
| මහනුවර | 29 | 16.6 (%) |
| කෑගල්ල | 1 | 0.6 (%) |
| කුරුණෑගල | 16 | 9.1 (%) |
| මාතලේ | 2 | 1.1 (%) |
| | | |
| මාතර | 9 | 5.1 (%) |
| නුවරඑළිය | 1 | 0.6 (%) |
| පොළොන්නරුව | 2 | 1.1 (%) |
| පුත්තලම | 22 | 12.6(%) |
| රත්නපුර | 5 | 2.9 (%) |
| ත්‍රිකුණාමලය | 1 | 0.6 (%) |
| **එකතුව** | **175** | **100** (%) |

ඒ අනුව දිස්ත්‍රික්ක 18 කින් මෙම මත විමසුම් සමීක්ෂණය සඳහා ප්‍රතිචාර ලැබී තිබේ. වැඩිම නියෝජනය මහනුවර දිස්ත්‍රික්කයෙන් ලැබී ඇති අතර එය 29 (16.6%) කි.


| | |
|---|---|
| 2.5 රැකියාවන්. | ❖ වැඩිම දත්තදායක ප්‍රමාණයක් සංවර්ධන නිලධාරින් ලෙස කටයුතු කරන අතර එය සංඛ්‍යාත්මකව 15 (8.6%) ක ප්‍රමාණයකි.<br>❖ මීට අමතරව ව්‍යාපාරිකයින් 11 (6.3%) ක්ද ගුරුවරු 10 (5%) ක්ද ශිෂ්‍යයන් 10 (5.7%) ක් ද සමීක්ෂණයට සම්බන්ධ වී ඇත. |

| | |
|---|---|
| 2.6 විවාහක අවිවාහක බව | ❖ අවිවාහක 90 (51.4%) ක් ද, විවාහක 80 (45.7%) ක්ද, වැන්දඹු 2 (1.1%) ක්ද, දික්කසාද 2 (1.1%) ක්ද, වෙනත් 1 (0.6%) ක්ද වේ. |


**<u>2.7 මත්ද්‍රව්‍ය භාවිතය අනුව දත්ත දායකයන්ගේ සංයුතිය.</u>**

මෙහිදි කෙදිනක හෝ දුම රහිත දුම්කොළ භාවිත කරන 52 (29.7%) දෙනෙක් දුම සහිත දුම් කොළ භාවිත කරන 12 (6.9%) දෙනෙක්ද, මද්‍යසාර භාවිත කරන 19 (10.9%) දෙනෙක්ද නියෝජනය විය. කෙදිනක හෝ මත්ද්‍රව්‍ය භාවිත නොකල පිරිස 92 (52.6%) කි. එය පහත 01 ප්‍රස්ථාරය ඇසුරින් තවදුරටත් පැහැදිලි කර ඇත.

වර්තමාන මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වභාවය සැලකිල්ලට ගැනීමේ දී දුම රහිත දුම්කොළ භාවිත කරන 13 (7.4%) දෙනෙක් වේ. දුම සහිත දුම් කොළ භාවිත කරන 16 (9.1%) දෙනෙක් වේ. මද්‍යසාර භාවිත පුද්ගලයන් 25 (14.3%) දෙනෙක් සහ කිසිදු ලෙසකින් භාවිත නොකරන 121 (69.1%) දෙනෙක් නියැදිය තුළ නියෝජනය විය.




01 ප්‍රස්තාරය




02 ප්‍රස්තාරය

## 3.මූලික මත විමසුම් ප්‍රතිඵලඃ

## ශ්‍රී ලංකාව තුළ සියලු ආකාරයේ මත්ද්‍රව්‍ය තහනම් කිරීම සඳහා එකඟතාවය.

| අනු අංක | විස්තරය | දැඩි ලෙස එකඟ වෙමි. | එකඟ වෙමි. | එකඟ නොවෙමි. | දැඩි ලෙස එකඟ නොවෙමි. | අදහසක් නොමැත | ප්‍රතිචාර දක්වා නොමැත. |
|---|---|---|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකාව තුළ සියලු ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිතය තහනම් කළයුතුය. | 54.4% | 22.9% | 10.3% | 2.9% | 8.6% | - |
| 02. | මත්ද්‍රව්‍ය ස්වල්ප ප්‍රමාණයක් හෝ ශරීරගත කරගැනීම අහිතකර වේ. | 46.9% | 28.6% | 12.6% | 1.1% | 9.7% | 1.1% |
| 03. | මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය සඳහා ලංකාවේ පවතින නීති අණ පණත් ප්‍රමාණාත්මක වේ. | 3.4% | 17.1% | 34.9% | 25.1% | 17.1% | 2.3% |
| 04. | මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය උදෙසා ක්‍රියාත්මක ආයතන ප්‍රමාණවත් වේ. | 4.0% | 24.6% | 37.1% | 12.0% | 18.9% | 3.4% |
| 05. | මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය කිරීමෙහිලා ක්‍රියාත්මක වන නිලධාරී යාන්ත්‍රණය ප්‍රමාණවත් වේ. | 5.1% | 17.1% | 38.3% | 17.1% | 18.9% | 3.4% |
| 06. | මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය කිරීමෙහිලා රජය වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ. | 3.4% | 17.1% | 32.0% | 14.9% | 29.7% | 2.9% |
| 07. | මත්ද්‍රව්‍ය හා මද්‍යසාර වලින් වැළකී සිටීමට අවශ්‍ය දැනුවත්වීම ලාංකීය අධ්‍යාපනය තුළින් ලැබේ. | 8.0% | 24.0% | 30.9% | 21.7% | 12.0% | 3.4% |
| 08. | මත්ද්‍රව්‍ය දුර්භාවිතය සම්බන්ධයෙන් පුද්ගලයන් දැනුවත් කිරීම සහ සවිබල ගැන්වීම සම්බන්ධ දැනට ක්‍රියාත්මක යාන්ත්‍රණය (වැඩසටහන්) ප්‍රමාණවත් වේ. | 3.4% | 19.4% | 30.9% | 19.4% | 23.4% | 3.4% |
| 09. | මත්ද්‍රව්‍ය නිවාරණයේ දි සාමාන්‍ය පොදු මහජනතාවට සුවිශේෂී කාර්යභාරයක් ඇත. | 54.3% | 36.6% | 1.1% | 2.3% | 2.9% | 2.9% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10. | මත්ද්‍රව්‍ය සැපයුම් යාන්ත්‍රණය අඩාල කිරිමෙහි ලා මහජනතාවට සුවිශේෂී කාර්යභාරයක් ඇත. | 47.4% | 37.7% | 4.0% | 1.7% | 6.3% | 2.9% |
| 11. | මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ට මරණ දඬුවම ලබාදීම සම්බන්ධයෙන් ඔබගේ එකගතාවය. | 42.3% | 20.0% | 10.9% | 8.0% | 16.0% | 2.9% |
| 12. | මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සඳහා උපදේශනයට අමතරව ඖෂධමය ප්‍රතිකාර ලබාදීම අවශ්‍ය වේ. | 41.1% | 36.0% | 6.9% | 2.3% | 12% | 1.7% |

ශ්‍රී ලංකාව තුළ සියලු ආකාරයේ මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීම/තහනම් කිරීමට එකග බහුතර පිරිසක් සිටින බව පෙනී යන ලදී. එය සමස්ත නියැදියෙන් 78.3%ක ප්‍රතිශතයකි. එසේම එය මිනිස් ශරීරයට අහිතකර වන බවට 75.5%ක ප්‍රතිශතයක් සවිඥානිකව සිටියි. එසේම මත්ද්‍රව්‍ය දුර්භාවිතය, නිවාරණය හා පාලනයෙහිලා ලංකාවේ පවතින නීති ප්‍රමාණවත් නොවන බවට පොදු මතයක් ඉදිරිපත් වී තිබේ. එය සමස්ත නියැදියෙන් 60%ක් වන අතරම ඒ සඳහා පැහැදිලි එකඟතාවයක් නොදක්වන 40%ක්ද නියැදිය තුළ නියෝජනය වී ඇත.

මත්ද්‍රව්‍ය නිවාරණයෙහිලා රාජ්‍ය යාන්ත්‍රණයේ මැදිහත්වීම ප්‍රමාණවත් බවට 36 දෙනෙක් (20.5%) ප්‍රකාශ කර ඇත. 29.7%ක ප්‍රතිශතයක් (52ක්) කිසිදු අදහසක් ප්‍රකාශ නොකර සිටීම සැළකිය යුතු වාතාවරණයක් වන අතරම නියැදියේ 82ක් (46.9%) ප්‍රමාණවත් නොවන බවට මතයක එළඹ සිටී. ලංකාවේ අධ්‍යාපන ක්‍රමය මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ දැනුවත් කිරිමෙහිලා ප්‍රමාණවත් කර්තව්‍යයක් ඉටු නොකරන බව නියැදියේ බහුතර පිළිගැනිමයි (52.6%).

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ වර්තමාන යාන්ත්‍රණය හා වැඩසටහන්, පුද්ගලයන් සවිබල ගැන්වීමේ ප්‍රමාණවත්භාවය පිළිබඳ වු මතය විමසිමේදී බහුතර මතය වී ඇත්තේ (50.3%) එය ප්‍රමාණවත් නොවන බවය.

මත්ද්‍රව්‍ය නිවාරණයේදී සාමාන්‍ය පොදු ජනතාවගේ භූමිකාවේ සුවිශේෂීභාවය පිළිබඳ විමසීමට ලක්කළ අතරම 159 දෙනෙකු (90.9%) එම මතයට එකඟව අදහස් පළ කර තිබේ. ඉතාම සුළු පිරිසක් 3.4%ක් පමණක් එම මතයට එකග නොවී ඇත. මේ අනුව පෙනී යන්නේ, මත්ද්‍රව්‍ය නිවාරණය, පාලනය සහ සවිබල ගැන්වීම යනාදී අංශවල ප්‍රමුඛ භූමිකාවක් "පුද්ගලයාට" පවතින බවට බහුතර මහජන මතයක් ගොඩනැගී තිබෙන බවය.

තවද මත්ද්‍රව්‍ය සැපයුම් යාන්ත්‍රණය අඩාල කිරිමෙහිලාද සාමාන්‍ය මහජනතාව මත කාර්යභාරයක් පවතින බවටද බහුතර පිළිගැනීමක් පවතින බව නිරීක්ෂණය විය. එය 149 (85.1%) කි. මත්ද්‍රව්‍ය ජාවාරම සඳහා සම්බන්ධ වුවන්ට මරණ දඬුවම් ලබාදීමට 109ක් (62.3%) එකඟතාවය පලකර තිබේ. උපදේශනයට අමතරව මත්ද්‍රව්‍ය නිවාරණයේදී ඖෂධවේදීමය ප්‍රතිකාරත්මක මැදිහත්වීමක් පැවතීම වැදගත්වන බව බහුතර මතය වී තිබේ (135 දෙනෙක්, 77.1%).

## 4. මත්ද්‍රව්‍ය නිවාරණ හා පාලන යාන්ත්‍රණය පිළිබඳ ආකල්පඃ

මෙහිදී මත්ද්‍රව්‍ය නිවාරණ හා පාලනයට අදාළව පුද්ගල ආකල්පයන් පිළිබඳ මත විමසුමට ලක්කරන ලදි. එහිදී ව්‍යුහගත ප්‍රශ්න සඳහා නියැදියට සහභාගි වූ පුද්ගලයන් ලබාදුන් පිළිතුරු ආශ්‍රය කරගනිමින් පහත විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත.

| අනු අංක | විස්තරය | ඔව් | නැත | ප්‍රතිචාර දක්වා නොමැත |
|---|---|---|---|---|
| 01. | ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වයට දුරකතන මාර්ගයෙන් උපදේශන සේවාවන් ක්‍රියාත්මක වනබව ඔබ දැනුවත්ද? | 35.4% | 62.3% | 2.3% |
| 02. | ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වය සම්බන්ධයෙන් නොමිලේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවා ක්‍රියාත්මක වන බවට ඔබ දැනුවත්ද? | 85.7% | 11.4% | 2.9% |
| 03. | ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් සඳහා ස්වෙච්ඡාවෙන් පුද්ගලයන්ට ඇතුළත් විය හැකි බව සම්බන්ධයෙන් ඔබ දැනුවත්ද? | 70.9% | 25.1% | 4.0% |
| 04. | මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වයෙන් සුවවීම කළ නොහැකි දෙයක් ලෙස ඔබ සිතන්නේද? | 7.4% | 88.0% | 4.6% |
| 05. | මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරී පුද්ගලයන් අවමානයට ලක්වීම සම්බන්ධයෙන් ඔබ එකඟ වන්නේද? | 12% | 82.9% | 5.1% |
| 06. | සමාජ අවමානය මගින් ඇබ්බැහිකාරී පුද්ගලයන්ගේ සුවවීම කෙරෙහි බලපෑමක් සිදුවිය හැකිබව ඔබ සිතන්නේද? | 61.7% | 34.3% | 4% |
| 07. | නීතියානුකුල මත්ද්‍රව්‍ය (සිගරට්/මධ්‍යසාර) පාලනකට යටත්ව අලෙවි කිරීම ඔබ අනුමත කරන්නේද? | 40.6% | 55.4% | 4% |

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරිත්වය සඳහා මැදිහත්වීමේ ක්ෂණික දුරකථන සේවාවාක් ක්‍රියාත්මක වන බවට ඉහුතර දැනුවත්භාවයක් 171 (97.7%) ක් පවතින නමුත් එම අංක මොනවාද? යන්න පිළිබඳ දැනුවත්භාවය විරල වේ. එහිදී 34 දෙනෙක් (19.4%) 1927 ක්ෂණික දුරකථන සේවාව පිළිබඳ දැනුවත්ව සිටි බව දක්වා ඇත.

මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙන් මිදීම සඳහා නොමිලේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන සේවාවන් මෙන්ම ප්‍රතිකාර සඳහා පුද්ගලයාට ස්වේච්ඡාවෙන් ප්‍රතිකාර මධ්‍යස්ථාන සඳහාද ඇතුළත් විය හැකි බවට සවිඥානිකත්වයක් පවතියි. එසේම මත්භාවිතයෙන් මිදීම හෝ සුවවීමේ හැකියාව පිළිබඳව නියැදියේ 154 (88%) ක බහුතරයගේ මතය වී ඇත්තේ සුවවීමේ හැකියාව පවතින බවයි. ඒ අනුව සමස්තයක් ලෙස පැහැදිලි වන්නේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙන් මිදීම සඳහා වන ප්‍රතිකාර හා පුනරුත්ථාපන යාන්ත්‍රණයක් පවතින බවට හා මත්ද්‍රව්‍ය ඇබ්බැහිකාරීත්වයෙන් සුවවීමේ හැකියාවක් පවතින බවට පුද්ගලයා සවිඥානික වන බවයි.

මෙම මත විමසුම් සමීක්ෂණය මඟින් ගම්‍ය වූ තවත් පැහැදිලි මතයක් වන්නේ, මත්භාවිත පුද්ගලයන් සමාජ අපගාමීන් ලෙස ලේබල් කිරීමකට බහුතර සමාජය එකඟ නොවන බව සහ එසේ නොකරන බවය. (එය සමස්ත නියැදියෙන් පුද්ගලයන් 145, 82.9%) ක නියෝජනයකි. එමෙන්ම පුද්ගලයා සමාජ අවමානයට ලක්වීම මත්භාවිත ඇබ්බැහියෙන් සුවවීම සඳහා බලපෑම් කරනු ලබන බවට නියැදියේ 108 දෙනෙක් (61.7%) විශ්වාස කරනු ලබයි.

එසේම (දුම්වැටි, මද්‍යසාර) පාලනයක් සහිතව පැවතීම පිළිබඳ මතය විමසීමේදී නියැදියේ බහුතරයක් 97ක් (55.4%) එය ප්‍රතික්ෂේප කර තිබුණද සැළකිය යුතු ප්‍රමාණයක් එනම් 71 දෙනෙක් (40.6%) එකඟතාව පලකර තිබේ. එසේම 7 දෙනෙකු මත පළ කිරීමෙන් වැළකීමද සිදු කර ඇත.

## 5. මත්ද්‍රව්‍ය භාවිතය සහ මාධ්‍ය.

මත්ද්‍රව්‍ය භාවිතය සහ මාධ්‍ය ක්‍රියාකාරීත්වය හා බලපෑම පිළිබඳවද මෙහිදී මතය විමසන ලදි. එහිදී (1) දැඩි ලෙස එකඟවෙමි (2) එකඟයි (3) අදහස් නැත (4) එකඟ නොවෙමි සහ (5) දැඩි ලෙස එකඟ නොවෙමි ලෙස අවස්ථා පහකින් අභිමත පරිදි තම මතය නියෝජනය කළහැකි අවස්ථාවන් සළකුණු කිරීමට අවස්ථාව ලබාදෙන ලදි. එම අදාළ ප්‍රශ්න සඳහා ලැබුණු පිළිතුරු දත්ත පහත දක්වා ඇත.

| අනු අංක | විස්තරය | දැඩි ලෙස එකඟවෙමි | එකඟ වෙමි | දැඩි ලෙස එකඟ නොවෙමි | එකඟ නොවෙමි | අදහසක් නොමැත | ප්‍රතිචාර දක්වා නොමැත |
|---|---|---|---|---|---|---|---|
| 01. | මත්ද්‍රව්‍ය හා මද්‍යසාර දිරිගැන්වීම සඳහා ශ්‍රී ලංකාවේ මාධ්‍ය සෘජුවම සම්බන්ධ වේ. | 21.7% | 32.6% | 2.9% | 22.9% | 16% | 4% |
| 02. | මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර දිරිගැන්වීම සඳහා ලංකාවේ මාධ්‍ය වක්‍රව කටයුතු කරනු ලබයි. | 28% | 49.7% | 1.7% | 6.3% | 10.3% | 4% |
| 03. | මද්‍යසාර/මත්ද්‍රව්‍ය භාවිතයට විරුද්ධව පුද්ගලයන් බල ගැන්වීමේදී මාධ්‍ය ප්‍රධාන භූමිකාවක් සහිත ආයතනයකි. | 37.1% | 37.1% | 3.4% | 10.9% | 8% | 3.4% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 04. | මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මාධ්‍ය භාවිතා වන ප්‍රමාණය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකිය. | 36% | 40% | 2.9% | 8% | 9.7% | 3.4% |
| 05. | මාධ්‍ය තරුණ පිරිස් සහ පාසල් සිසුන් සඳහා ප්‍රබල බලපෑම්කාරකයක් වනු ඇත. | 52.6% | 32.6% | 2.3% | 2.9% | 6.3% | 3.4% |

මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා මාධ්‍ය භාවිතය මෙන්ම එහි බලපෑම සමීක්ෂණය තුළ අධ්‍යයනය කරන ලදී. මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර දිරිගැන්වීම සඳහා ලංකාවේ මාධ්‍ය ඍජුව කටයුතු කරයි යන්න සම්බන්ධයෙන් පුද්ගලයන් 95 දෙනෙක් (54.3%) එකඟව මත පලකර තිබේ. නමුත් මත්ද්‍රව්‍ය සහ මද්‍යසාර දිරිගැන්වීම සඳහා ලංකාවේ මාධ්‍ය වක්‍රව කටයුතු කරනු ලබන බවට පැහැදිලි බහුතර මතයක් දක්වා තිබේ. එය පුද්ගලයන් 136 දෙනෙක් (77.7%) ප්‍රකාශ කර ඇත. මේ අනුව අපට නිගමනය කළ හැක්කේ ලංකාවේ මත්ද්‍රව්‍ය හා මද්‍යසාර දිරිගැන්වීම සඳහා මාධ්‍යයන් විසින් ඍජු ක්‍රමෝපායන්ට සාපේක්ෂව වක්‍ර ක්‍රමෝපායන් භාවිත කරන බවට පුද්ගලයන් සවිඥානික බවය.

එසේම මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතයට විරුද්ධව පුද්ගලයන් බලගැන්වීමේදි මාධ්‍ය ප්‍රධාන භූමිකාවක් ඉටුකරන බවටද බහුතර පිළිගැනීමක් පවතී. එනම් එය සමස්ත නියැදියෙන් පුද්ගලයන් 130 ක (74.2%) නියෝජනයකි. පුද්ගලයන් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා බලගැන්වීමට මාධ්‍යයට ප්‍රබල භූමිකාවක් පැවතියද මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මාධ්‍ය භාවිත වන ප්‍රමාණය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බවට 133 දෙනෙක් ( 76%) ප්‍රකාශ කර ඇත. මත්ද්‍රව්‍ය නිවාරණයෙහිලා මාධ්‍ය මීට වඩා ප්‍රබලව කටයුතු කළ යුතු බව මහජන ස්ථාවරයක් ගොඩනැගී ඇත.

එසේම මාධ්‍ය තරුණ පිරිස් සහ පාසල් සිසුන් සඳහා ප්‍රබල බලපෑම් කාරකයක් වන බවට පුද්ගලයින් 149 (85.2%) ක් සංජානනයක් පවතී. ඒ අනුව මෙම ප්‍රබල මතය මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මාධ්‍යයන්ට ධනාත්මක ආකාරයෙන් භාවිත කළ හැකිවේ.

**6.කංසා/ ගංජා භාවිතය හා ව්‍යාප්තිය**

කංසා භාවිතය හා ව්‍යාප්තියට අදාළව මත විමසුමක්ද සිදු කරන ලදී. එහිදී "ඔව්" හා "නැත" යන අවස්ථාවන්ගෙන් එකක් තෝරා ගෙන පිළිතුරු සැපයීමට අවස්ථාව ලබාදුන් අතර ඒ සඳහා ලැබුණු සාරාංශගත කරන ලද ප්‍රතිචාර පහත දක්වා ඇත.

| අනු අංක | විස්තරය | ඔව් | නැත | ප්‍රතිචාර දක්වා නොමැත |
|---|---|---|---|---|
| 01. | කංසා මත්ද්‍රව්‍යයක් යැයි ඔබ විශ්වාස කරන්නේද? | 65.7% | 31.4% | 2.9% |
| 02. | කංසා දැඩි ඇබ්බැහිකාරි මත්ද්‍රව්‍යයක් යැයි ඔබ පිළිගන්නේද? | 65.7% | 31.4% | 2.9% |
| 03. | කංසා භාවිතය නීතිගත කළයුතු වේද? | 36.6% | 58.9% | 4.6% |

| | | | | |
|---|---|---|---|---|
| 04. | කංසා භාවිතය රිය අනතුරු ඇති වීමට හේතුවක් බව ඔබ විශ්වාස කරන්නේද? | 62.3% | 32% | 5.7% |
| 05. | කංසා භාවිතය නිසා අපරාධ ක්‍රියාවන්ට පුද්ගලයන් යොමු විය හැකි බව ඔබ විශ්වාස කරන්නේද? | 62.9% | 31.4% | 5.7% |
| 06. | කංසා භාවිතය මානසික ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට බාධාවක් ලෙස ඔබ විශ්වාස කරන්නේද? | 66.3% | 28% | 5.7% |
| 07. | දීර්ඝ කාලීන කංසා භාවිතය මතකය සම්බන්ධ ගැටලු ඇති කරවීම කෙරෙහි බලපාන බව ඔබ විශ්වාස කරන්නේද? | 73.1% | 22.3% | 4.6% |
| 08. | ඇතැම් රෝග තත්ත්ව වලින් වැළකී සිටීමට ගංජා භාවිතය යෝග්‍ය යැයි ඔබ සිතන්නේද? | 41.1% | 54.3% | 4.6% |
| 09. | (අන්තර්ජාලය ආශ්‍රිත) සමාජ මාධ්‍ය ජාලයන් මඟින් කංසා ප්‍රවර්ධනය සිදුවන බවට ඔබ දැනුවත්ද? | 59.4% | 36.6% | 4.0% |
| 10. | එම ප්‍රවර්ධනයන් තුළ ඔබට කවදා හෝ කංසා භාවිතා කර බැලීමට සිත්වී තිබේද? | 12.6% | 73.1% | 14.3% |
| 11. | කංසා ප්‍රවර්ධනය සඳහා කරනු ලබන ප්‍රචාරණ දිරි ගැන්වීම ඊට විරුද්ධ කරනු ලබන නිවාරණ වැඩසටහන් මඟින් කළ හැකි බව ඔබ සිතන්නේද? | 50.9% | 42.3% | 6.9% |
| 12. | ගංජා භාවිතයෙන් නිර්මාණශීලිත්වය ඇති වන බව ඔබ විශ්වාස කරන්නේද? | 21.1% | 73.1% | 5.7% |

කංසා/ගංජා මත්ද්‍රව්‍යයක් වන බවත් , එය දැඩි ඇබ්බැහිකාරී මත්ද්‍රව්‍යයක් වන බවටත් පුද්ගලයින් 115 (65.7%) නියැදියේ බහුතර පිළිගැනීමක් පවති. නමුත් කංසා මත්ද්‍රව්‍යක් ලෙස හෝ එය දැඩි ඇබ්බැහිකාරීත්වයක් සහිත මත්ද්‍රව්‍යක් බවට පිළිනොගන්නා 55 දෙනෙක් (31.4%) සිටීමද සැලකිල්ලට භාජනය කළ යුතු තත්වයක් වේ. කංසා භාවිතය නීතිගත නොකළ යුතු බවට නියැදියේ 103 ක් (58.9%) දක්වා සිටී. නමුත් කංසා භාවිතය නීතිගත කළ යුතු බවට පිළිගන්නා පුද්ගලයින් 64 දෙනෙකුගේ (36.6%) නියෝජනයක්ද පවතී. සාපේක්ෂව එය විමර්ශනයට ලක්කල යුතු තත්වයකි.

කංසා භාවිතය රිය අනතුරු ඇතිවීමටත් (62.3%) , අපරාධ චර්යාවන්ට/ක්‍රියාවන්ට පුද්ගලයන් යොමුවිය හැකි බවටත් (62.9%) බහුතර මහජන මතයක් ගොඩනැගී පවතී. නමුත් එසේ සිදුනොවන බවට පිළිගන්නා පිරිසක්ද නියැදිය තුළ පැහැදිලිව සිටින බවට දත්ත විශ්ලේෂණය කිරීමේ දී ගම්‍ය විය (32%ක්). දිර්ඝ කාලීන කංසා භාවිතය මානසික ඒකාග්‍රතාවය පවත්වාගැනීමට බාධාවක් වන බවට 66.3%ක් ,මතකය සම්බන්ධ ගැටලු ඇති කරන බවටත් 73.1% ක් අතර බහුතර මතයක් ගොඩනැගී තිබෙන බව පෙනී යයි.

ඇතැම් රෝග තත්ත්ව වලින් වැළකී සිටීමට ගංජා භාවිතයේ බලපෑමක් නොමැති බව නියැදියේ 95 දෙනෙක් (54.3%) පිළිගනු ලැබුවද, 72 දෙනෙක් (41.1%) එය යෝග්‍ය යැයි පිළිගෙන තිබේ. සමාජ මාධ්‍ය ජාලයන් (අන්තර්ජාලය) මඟින් කංසා ප්‍රවර්ධනය සිදුවන බවට 104 දෙනෙක් (59.4%) පිළිගනු ලබන අතරම එයින් 22 දෙනෙක් (12.6%) ක් පමණක් එම ප්‍රවර්ධනයන් තුළින් තමන්ට එය භාවිත කර බැලීමට සිත් වූ බව දක්වයි.

කංසා ප්‍රවර්ධනය ඊට විරුද්ධව කරන නිවාරණ වැඩසටහන් මඟින් කළ හැකි බවට නියැදියේ 89 දෙනෙක් (50.9%) පිළිගනු ලැබුවද පුද්ගලයන් 74ක් (42.3%) එසේ සිදුකළ නොහැකි බව දක්වනු ලබයි. සමස්තයක් ලෙස කංසා භාවිතය හා ව්‍යාප්තිය සම්බන්ධයෙන් වූ මහජන මතය විමර්ශනය කර බැලීමේදී 60%-70% අතර ප්‍රතිශතයක් ගංජා භාවිතය ව්‍යාප්තිය හා ප්‍රවර්ධනය වැනි කරුණු පිළිබඳව සවිඥානික ප්‍රතිචාර දක්වන අතර 30% - 40% අතර ප්‍රතිශතයක් ගංජා දුර්භාවිතය හා ප්‍රවර්ධනයට එකඟව කටයුතු කරන බව ගම්‍ය වේ. එය නියැදියේ ප්‍රතිචාර සමඟ සමස්තයක් ලෙස සංසන්දනාත්මකව අධ්‍යයනය කළ හැකි වේ.

## 9. නිගමන හා යෝජනා:

### 9.1 නිගමන.

- සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය නිවාරණය හා පාලනය උදෙසා ක්‍රියාත්මක වන ආයතන ව්‍යුහය හා යාන්ත්‍රනයට අදාළව පවතින නීති', ආයතනික ව්‍යුහය හා යාන්ත්‍රණය, නිළධාරී ව්‍යුහය, රාජ්‍ය මැදිහත් වීම ප්‍රමාණවත් නොවන බවට මහජන මතයක් පවතී.
- මත්ද්‍රව්‍ය දුර්භාවිත නිවාරණ හා පාලනය උදෙසා නිතීය, ආයතනික ව්‍යුහය හා රාජ්‍ය මැදිහත් වීමට සාපේක්ෂව පොදු මහජනතාව මත විශාල භූමිකාවක් පවතින බවට මහජන මතයක් ඇත.
- මත්ද්‍රව්‍ය භාවිතය හා මාධ්‍ය ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන්
  - මත්ද්‍රව්‍ය හා මද්‍යසාර ප්‍රචාරණය සඳහා ශ්‍රී ලංකාවේ මාධ්‍ය ඍජුව හා වක්‍රව කටයුතු කරන බවට මහජන මතයක් පවතියි.
  - තරුණ පිරිස් හා පාසල් සිසුන් සඳහා මාධ්‍ය ප්‍රබල බලපෑම්කාරකයක් වන බව,
  - මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා මාධ්‍ය භාවිතා වන ප්‍රමාණය පිළිබඳ ව සෑහීමකට පත් විය නොහැකි බව

    හා
  - මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතයට විරුද්ධ ව පුද්ගලයින් බලගැන්වීමේ දී මාධ්‍ය ප්‍රධාන භූමිකාවක් ලෙස කටයුතු කිරීම අපේක්ෂා කරන බව යි.
  - කංසා මත්ද්‍රව්‍යයක් හා දැඩි ඇබ්බැහිකාරී මත්ද්‍රව්‍යයක් ලෙසට බහුතර පිළිගැනීමක් පැවතිය ද අවධානය යොමු කළයුතු වැරදි සංජානනයන්ද පවතී.

**යෝජනා:**

- පවතින යහපත් පුද්ගල සවිඥානිකත්වය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක සාක්ෂි මත පදනම් වූ කරුණු සමාජගත කිරීම.